# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## නීති පීඨය
## නීතිවේදී ගෞරව උපාධිය
## පළමු සෙමෙස්තරය අවසාන පරීක්ෂණය - III වන වසර - 2025

## Law 31302 - මානව හිමිකම් නීතිය

(කාලය : පැය 2 ¼)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 04

ප්‍රශ්න <u>දෙකකට (02) පමණක්</u> පිළිතුරු සපයන්න.

(අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.)

1. අන්තර්ජාතික මානව හිමිකම් නීතියේ ඓතිහාසික පරිණාමය බොහෝ විට, බටහිර කේන්ද්‍රීය පදනම් හී මුල් බැස ඇති සේ දැකීම එහි ගෝලීය විවිධත්වය පිළිබිඹු කිරීමට ඇති නොහැකියාව පිළිබඳ විවේචනයන්ට මහපාදා ඇත. ඒ නමුදු, මානව හිමිකම් පිළිබඳ සමකාලීන කතිකාව ගෝලීය දකුණේ හි (Global South) දෘෂ්ටිකෝණයන්ගෙන් (perspectives) වැඩි වැඩියෙන් අභාශය ලබා තිබේ.

   අන්තර්ජාතික මානව හිමිකම් නීතියේ ඓතිහාසික වර්ධනයට අවධානය යොමු කරමින්, මෙම විවාදය පිළිබඳව සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර, මෙම විවාදයේ එක් එක් පැති සඳහා <u>අවම වශයෙන් උදාහරණ දෙකක්</u> සහිතව තහවුරු කරන්න.

   (ලකුණු 30)

2. මානව හිමිකම් හි විශ්වීයත්වය සහ සංස්කෘතික සාපේක්ෂතාවාදය අතර විවාදය, ගෝලීය දකුණ (Global South) සහ ගෝලීය උතුර (Global North) අතර ආතතීන් මගින් හැඩගැසෙමින් පවතී. ගෝලීය උතුරේ විද්වතුන්ගේ අදහස වන්නේ, සංස්කෘතික සාපේක්ෂතාවාදය යන්න, බොහෝ අවස්ථාවන්හී දී, වෙනස්කොට සැලකීමේ පරිචයන්, විශේෂයෙන් කාන්තාවන්ට එරෙහිව සිදුවන වෙනස්කම්, සම්ප්‍රදායේ නාමයෙන් සාධාරණීකරණය කිරීමට සහ සංරක්ෂණ කිරීමට යොදා ගන්නා බවයි.

   ඉහත ප්‍රස්තුතයට ඔබ එකඟවන්නහි ද? ඔබ ගේ පිළිතුර අන්තර්ජාතික සම්මුතිමය ප්‍රතිපාදනයන්ගෙන් අදාල උදාහරණ සහ අවම වශයෙන් තෝරාගත් සිද්ධි අධ්‍යයන තුනක් සමඟ තහවුරු කරන්න.

   (ලකුණු 30)

3. (අ) සහ (ආ) යන කොටස් දෙකට ම පිළිතුරු සපයන්න:

(අ) 2006 දී, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (කවුන්සිලය) විසින් මානව හිමිකම් කොමිසම ප්‍රතිස්ථාපනය (Replaced) කරන ලදී. කවුන්සිලය විසින්, ගෝලීය වශයෙන් මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම වැඩි දියුණු කිරීම අරමුණු කරගත් නව්‍ය යාන්ත්‍රණයන් හඳුන්වා දෙන ලදී. මෙකී ප්‍රඥප්තිය පදනම් කරගත් නව්‍ය මානව හිමිකම් යාන්ත්‍රණයන් අතරින් ඔබ කැමති එක් යාන්ත්‍රණයක් තෝරාගෙන එය අන්තර්ජාතික මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා කෙතරම් දායක වී ඇත්දැයි ඇගයීමට ලක් කරන්න. ඔබ ගෙ පිළිතුර හී ඔබ තෝරාගත් යාන්ත්‍රණය හී වැදගත් ලක්ෂණ ඇතුලත්විය යුතු අතර එහි දායකත්වය විදහාපෑමට සුදුසු උදාහරණ අවම වශයෙන් දෙකක්වත් ඇතුළත් විය යුතුය. ඔබේ පිළිතුර අදාල අන්තර්ජාතික ලේඛනයන් හී (international instruments ) ප්‍රතිපාදන ඇසුරින් තහවුරු කරන්න.

(ලකුණු 20)

(ආ) සිලෝනිකා ෆෙඩරල් ජනරජය එක්සත් සාම සංවිධානයේ සාමාජිකයෙකි. සිලෝනිකා හි විශ්වවිද්‍යාල ශිෂ්‍යාවක් වන ටීනා, සිසුන් විසින් මෙහෙයවනු ලබන මාර්ගගත සඟරාවක් සඳහා සමාජයේ සමකාලීන ගැටළු පිළිබඳව විශේෂාංග ලිපි ලියයි. මෑතකදී සිලෝනිකා හී රජය එහි 2025-2035 සඳහා වන ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කළ අතර, එය පුළුල් ප්‍රජාවක ගේ විවේචනයට භාජනය වී ඇත. බොහෝ දෙනා කියා සිටින්නේ මෙම න්‍යාය පත්‍රය තිරසාර සංවර්ධන ඉලක්ක නොසලකා හරින බවත්, සිලෝනිකා හී ජනතාවගේ සංවර්ධන සඳහා වන අයිතියේ හී ප්‍රධාන මූලිකාංගයනට අනුගතවීමට අපොහොසත් වන බවත්ය. ටීනා, සිය පුරවැසියන්ගේ අභිවෘද්ධිය සඳහා සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේදී සිලෝනිකා සතු වගකීම සාකච්ඡා කරමින් ඇයගේ ලිපිය ලිවීමට අදහස් කරයි. මෙම ලිපිය ට මානව හිමිකම් පිළිබඳ දෘෂ්ටිකෝණයන් (perspectives) ඇතුළත් කිරීම සඳහා ඇය, සමකර්තෘ ලෙස ඔබගේ දායකත්වය අපේක්ෂා කරයි. විශේෂාංග ලිපියට ඇතුළත් කිරීම සඳහා අන්තර්ජාතික මානව හිමිකම් නීතිය යටතේ සංවර්ධනය ට ඇති අයිතිය පිළිබඳ නීතිමය විශ්ලේෂණයක් සකස් කරන්න. ඔබගේ කෙටුම්පතෙ හී අදාළ ජාත්‍යන්තර ලේඛන, ප්‍රතිපාදන සහ සංවර්ධනයේ අයිතියට අදාළ ප්‍රධාන මූලිකාංග ඇතුළත් විය යුතුය.

(ලකුණු 10)

4 සුගරි, සූරි ලැන්ඩ් හි අන්තර්ජාතිකව අරමුදල් සපයන සිවිල් සමාජ සංවිධානයක් වන 'වොයිස් ෆෝ ජස්ටිස්' (VFJ) හි විධායක සාමාජිකයෙකු වන අතර, මෑතකදී යුක්තිය සඳහා ප්‍රවේශවීමේ ව්‍යාපෘතියක නිරත විය. මෙම ව්‍යාපෘතිය යටතේ, සුගරි අතුරුදහන්වූවන්ගේ පවුල් සඳහා යුක්තියට ප්‍රවේශවීම ප්‍රවර්ධනය කිරීම පිණිස මහජන ව්‍යාපාරයක් හරහා මූලාරම්භයක් ගන්නා ලදී. මෙම ව්‍යාපාරයේ ප්‍රකාශිත අරමුණු සත්‍ය සෙවීම සහ සංහිඳියාව සමඟ සමපාත වුවද, VFJ තම පුළුල් න්‍යාය පත්‍රය මහජනතාවට හෙළිනොකිරීමට තීරණය කළ අතර, මෙකී මූලාරම්භය සඳහා හිතාමතාම සූරි ලැන්ඩ් හි දකුණු කොටසේ ඇති එක් නිශ්චිත ජනවාර්ගික කණ්ඩායමක් තෝරා ගත්තේය. මෙම ව්‍යාපාරය ජනප්‍රිය වීමත් සමඟ, එය යුක්තිය සඳහා ප්‍රවේශවීමේ ජාතික ප්‍රතිපත්තියට අනනුකූල බව පෙනෙන්ට විය . ඊට ප්‍රතිචාර වශයෙන්, සූරි ලැන්ඩ් හි ත්‍රස්ත විමර්ශන අංශය සුගරි සහ ඇගේ කණ්ඩායම නිරීක්ෂණය සහ ප්‍රවීක්ෂණය (Surveillance) කිරීම ආරම්භ කළේය. ඊට අමතරව, රජයේ නියෝජිතයන් VFJ ට එරෙහිව උපහාසාත්මක, බිය ගැන්වීමේ සහ විවේචනාත්මක ප්‍රකාශ නිකුත් කළහ. ඉන්පසු , VFJ සංවිධානය සාමකාමී පෙළපාලි සහ මහජන ව්‍යාපාර පැවැත්වූ නමුත් එහි නායකයින් අත්අඩංගුවට ගෙන යුක්තිය සඳහා ප්‍රවේශය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිවලට බාධා කිරීම සහ මහජන සාමයට තර්ජනය කිරීම යන චෝදනා යටතේ ඔවුන්ට චෝදනා එල්ල කරන ලදී. සිවිල් සමාජ සංවිධාන ජාතික ආරක්ෂාව අඩපණ නොකළ යුතු බව රජය කියා සිටින අතර, විදේශීය ක්‍රියාකාරීන්ගේ බලපෑමට යටත්ව VFJ ක්‍රියා කරන බව රජය චෝදනා කරයි.

ඔබ මානව හිමිකම් පිළිබඳ නීතිඥයෙකු යැයි උපකල්පනය කරන්න. මානව හිමිකම් ආරක්ෂා කිරීමේදී සිවිල් සමාජයේ කාර්යභාරය සාකච්ඡා කරන්න. තවද, මෙම තත්ත්වය තුළ VFJ හට තම අයිතිවාසිකම් ආරක්ෂා කර ගත හැකි ආකාරය විශ්ලේෂණය කරන්න. සූරි ලැන්ඩ් හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට සමාන බව උපකල්පනය කරන්න. ඔබගේ පිළිතුර අන්තර්ජාතික සම්මුතීන්, ප්‍රකාශන, දේශීය නීති ප්‍රතිපාදන සහ සිද්ධි අධ්‍යයනයන් ඇසුරෙන් තහවුරු කරන්න.

(ලකුණු 30)

*******